**නව නිපැයුම්කරුවන්ගේ "ධාරිතා සංවර්ධනය" සඳහා කෙටි කාලීන පාඨමාලා**

**අයදුම් කිරීම සඳහා මාර්ගෝපදේශය**

## 01. පසුබිම

ශ්‍රී ලාංකීය නව නිපැයුම්කරුවන් දැනුමින් පෝෂණය කර සිය නව නිපැයුම් සාර්ථක ලෙස ඉදිරියට ගෙන යාම සඳහා අවශ්‍ය ශක්‍යතාවයන් නව නිපැයුම්කරුවන් වෙත ලබා දී ඔවුන්ගේ "ධාරිතා සංවර්ධනය" අපේක්ෂා කරගනිමින් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත.

මෙම වැඩසටහන යටතේ නව නිපැයුම්කරුවන් වෙත අවශ්‍ය බාහිර දැනුම ලබාගැනීම සඳහා *"ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI)", "ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය (OUSL)", "ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය (CASL)", "කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB)", "කාර්මික තාක්ෂණ ආයතනය (ITI) සහ "නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය (ACCIMT)"* ආදී ආයතන හරහා කෙටි කාලීන පාඨමාලා 26ට අධික සංඛ්‍යාවක් නව නිපැයුම්කරුවන් වෙත ලබාදීමට කොමිසම මඟින් කටයුතු සූදානම් කර ඇත.

## 02. සුදුසුකම් ලබන නව නිපැයුම්කරුවන්

මෙම කෙටි කාලීන පාඨමාලා සඳහා සහභාගී වීම වෙනුවෙන් මූල්‍ය ආධාර ලබා ගැනීමට නව නිපැයුම්කරුවන් සුදුසුකම් ලැබීම පිළිබඳ විස්තරය පහත දැක්වේ. එහිදී පහත සඳහන් කාණ්ඩ යටතට ඇතුළත් වන නව නිපැයුම්කරුවන්ට අයදුම් කිරීමට අවස්ථාව ඇත.

- නව නිපැයුම්කරුවන් සඳහා වන හැඳුනුම්පත ලබාගත් නව නිපැයුම්කරුවන්ගේ නිල ලේඛනයේ දැනට ලියාපදිංචි වී ඇති ඕනෑම නව නිපැයුම්කරුවෙකු
- නව නිපැයුම්කරුවන් සඳහා වන හැඳුනුම්පත ලබා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති සහ ඒ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබන නව නිපැයුම්කරුවන්
- 2023 සහ 2024 වසරවල පැවැත්වූ "සහසක් නිමවුම්" ජාතික නව නිපැයුම් ප්‍රදර්ශනය සහ තරගාවලියන්හි සම්මාන දිනූ නව නිපැයුම්කරුවන්
- 2025 වසරේ පැවැත්වූ "සහසක් නිමවුම්" ජාතික නව නිපැයුම් ප්‍රදර්ශනය සහ තරගාවලිය සඳහා සහභාගී වීමට සුදුසුකම් ලැබූ නව නිපැයුම්කරුවන්

## 03. සුදුසුකම් ලබන නව නිපැයුම්කරුවන් සඳහා මූල්‍යමය සහයෝගය

කොමිසම මඟින් පහසුකම් ලබා දෙනු ලබන කෙටි කාලීන පාඨමාලා සඳහා සුදුසුකම් ලබන නව නිපැයුම්කරුවන් හට 2026 වර්ෂය සඳහා උපරිමය රුපියල් 20,000/- ක් දක්වා පාඨමාලා ගාස්තුවක් කොමිසම විසින් ගෙවීම් කරනු ලබයි.

සුදුසුකම් ලත් නව නිපැයුම්කරුවන් අතරින්, තමන් කැමති පාඨමාලාවක් හෝ පාඨමාලා කිහිපයක් හැදෑරීම සඳහා මූල්‍ය ආධාර ලබා දීමට නව නිපැයුම්කරුවන් 100 දෙනෙකු තෝරා ගනු ලැබේ. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් මෙම මූල්‍ය ආධාර පිරිනමනු ලබන්නේ නව නිපැයුම්කරුවන් සඳහා වන හැඳුනුම්පත් වර්ගීකරණය මත පදනම්වය. එහි දී නව නිපැයුම්කරුවන් සඳහා වන හැඳුනුම්පතක් ලබාගෙන තිබීම අත්‍යාවශ්‍ය නොවන අතර ඒ සඳහා සුදුසුකම් ලැබීම ද ප්‍රමාණවත් වේ.

- 01, 02 හෝ 03 යන කාණ්ඩ යටතේ නව නිපැයුම්කරුවන් සඳහා වන හැඳුනුම්පත් දරන්නන්ට හෝ ඒ සඳහා සුදුසුකම් ලබන්නන්ට උපරිම වශයෙන් රුපියල් 20,000/- ක මුදලක් හිමිවේ.
- 04 හෝ 05 යන කාණ්ඩ යටතේ නව නිපැයුම්කරුවන් සඳහා වන හැඳුනුම්පත් දරන්නන්ට හෝ ඒ සඳහා සුදුසුකම් ලබන්නන්ට උපරිම වශයෙන් රුපියල් 10,000/- ක මුදලක් හිමිවේ.

## 04. නව නිපැයුම්කරුවන් සඳහාම වන හැඳුනුම්පත්ලාභියකු වීම සඳහා සුදුසුකම් ලැබීම සඳහා වන කොන්දේසි

සෑම ඉල්ලුම්කරුවෙක්ම පහත සඳහන් කර ඇති ක්ෂේත්‍ර 01ක් හෝ කිහිපයක් යටතේ සුදුසකම් ලැබිය හැකිය.

- කාණ්ඩය 01 - ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය මගින් නිකුත් කරන ලද පේටන්ට් බලපත්‍රය හිමි සියළු ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ට ජීවිත කාලය පුරාවට බල පවතින පරිදි හැඳුනුම්පතක් ලබා ගැනීමට අයිතිය හිමි වේ.
- කාණ්ඩය 02 - වෙනත් රටකින් නිකුත් කර ඇති පේටන්ට් බලපත්‍ර හිමි ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ට සිය ජීවිත කාලය පුරාවට බල පවතින පරිදි හැඳුනුම්පතක් ලබා ගැනීමට අයිතිය හිමි වේ.
- කාණ්ඩය 03 - ජාත්‍යන්තරව පිළිගත් පේටන්ට් සහයෝගිතා ගිවිසුම (PCT) යටතේ ආවරණයක් ලබා ඇති සියලු ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන් හට, එම ආවරණය වලංගු වන කාල සීමාව තුල බල පැවැත්වෙන පරිදි හැඳුනුම්පතක් ලබා ගැනීම සඳහා අයිතිය හිමි වේ.

- කාණ්ඩය 04 - පේටන්ට් බලපත්‍ර සඳහා අයදුම් කර ඇති සියලු ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ට ඒ සඳහා ලියාපදිංචි වූ දින සිට වසර 2ක කාලසීමාවක් දක්වා වලංගු වන පරිදි හැඳුනුම්පතක් ලබා ගැනීමට අයිතිය හිමි වේ. පේටන්ට් බලපත්‍රය නිකුත් කිරීම මේ අතර කාලයේ දී සම්පූර්ණ නොවිණි නම් අදාල නිකුත් කිරීම දක්වා එක් වසර බැගින් කාලය දීර්ඝ කල හැකි ය.
- කාණ්ඩය 05 - ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සංවිධානය කරන “සහසක් නිමැවුම්” ජාතික නව නිපැයුම් ප්‍රදර්ශනය හා තරඟය සඳහා ඉදිරිපත් වී ජයග්‍රහණ (පළමු/ දෙවන හෝ තෙවන ස්ථාන) ලැබූ නමුත් පේටන්ට් බලපත්‍රය ලබා ගැනීමට නොහැකිවූ ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ට ජයග්‍රහණය ලැබූ දින සිට වසර 02ක කාල සීමාවක් දක්වා වලංගු වන පරිදි හැඳුනුම්පතක් ලබා ගැනීමට අයිතිය හිමි වේ. එම නිපැයුම්කරු ඒ හා සමාන ජයග්‍රහණයක් එම වසර 02 තුළදී වෙනත් නව නිපැයුමක් සඳහා නැවත ලබාගත හොත් එම ජයග්‍රහණය ලැබූ දින සිට වසර 02ක කාල සීමාව දක්වා එම හැඳුනුම්පතේ වලංගුභාවය දීර්ඝ කෙරේ.

## 5. නව නිපැයුම්කරුවන් තෝරාගැනීම සිදුකරන ආකාරය

මෙම වැඩසටහන සඳහා අයදුම් කිරීමට සකස් කර ඇති අයදුම්පත්‍රය නව නිපැයුම්කරුවන් විසින් සම්පූර්ණ කර කොමිසම වෙත යොමුකිරීමෙන් අනතුරුව ඇගයීම් නිර්ණායක අනුව නව නිපැයුම්කරුවන් වෙත ලකුණු ලබාදීම සිදු කරනු ලබයි. එහි දී ඉහලම ලකුණු ලබාගන්නා නව නිපැයුම්කරුවන් 100ක් මෙම වැඩසටහන සඳහා තෝරාගනු ලබයි.

## 6. අයදුම් කල යුතු ආකාරය

මෙම වැඩසටහන සඳහා අයදුම් කිරීමට සකස් කර ඇති අයදුම්පත්‍රය මනාව කියවා සම්පූර්ණ කර සිය අත්සන යොදා කොමිසම වෙත යොමුකළ යුතුය.

එහි දී සිය අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති ඔබගේ සහභාගීත්වයන්, ජයග්‍රහණයන්, ලබාගෙන ඇති හෝ අපේක්ෂිත පේටන්ට් බලපත්‍ර පිළිබඳ විස්තර තහවුරු කිරීමට අවශ්‍ය සියලුම සහතික පත්‍ර සහ පේටන්ට් බලපත්‍රයේ මුල් පිටු දෙකෙහි පැහැදිලි පිටපත් මෙම අයදුම්පත සමඟ එවිය යුතුය. එවැනි පැහැදිලි පිටපත් සමඟ ඉදිරිපත් නොකෙරෙන අයදුම්පත් කිසිදු හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

සහසක් නිමැවුම් 2023 සහ 2024 වර්ෂයන් සඳහා පමණක් අදාල ජයග්‍රාහී නව නිපැයුම්කරුවන්ගේ ජයග්‍රහණ තහවුරු කිරීම සඳහා එම සහතික පිටපත් ඇමුණුම් කල යුතු නොවේ. එසේ වුව ද අනෙකුත් වර්ෂයන්හි ජයග්‍රහණ තහවුරු කිරීම සඳහා සහතික පිටපත් ඇමුණුම් කිරීම අත්‍යාවශ්‍ය වේ.

**7. අයදුම්පත්‍රය භාගත කරගැනීම පහත ක්‍රමවේදයන් හරහා සිදුකල හැකිය.**

| | |
|---|---|
| ➢ මෙම දිගුව හරහා පිවිසෙන්න | https://shorturl.at/7UblN |
| ➢ මෙම QR කේතය පරිලෝකනය කරන්න | |
| ➢ කොමිසමේ වෙබ් අඩවිය හරහා පිවිසෙන්න | https://slic.gov.lk/short-courses/ |

**8. ඇගයීම් නිර්ණායකයන් භාගත කරගැනීම පහත ක්‍රමවේදයන් හරහා සිදුකල හැකිය.**

| | |
|---|---|
| ➢ මෙම දිගුව හරහා පිවිසෙන්න | https://shorturl.at/Ldvuq |
| ➢ මෙම QR කේතය පරිලෝකනය කරන්න | |
| ➢ කොමිසමේ වෙබ් අඩවිය හරහා පිවිසෙන්න | https://slic.gov.lk/short-courses/ |

**9. පාඨමාලා විස්තර පහත දැක්වෙන ක්‍රමවේදයන් හරහා භාගත කරගත හැකිය:**

| | |
|---|---|
| ➢ මෙම දිගුව හරහා පිවිසෙන්න | https://shorturl.at/0YNgG |
| ➢ මෙම QR කේතය පරිලෝකනය කරන්න | |
| ➢ කොමිසමේ වෙබ් අඩවිය හරහා පිවිසෙන්න | https://slic.gov.lk/short-courses/ |

**10. අවසාන දිනය**

ඔබගේ අයදුම්පත 2026.05.22 දින හෝ එදිනට ප්‍රථමව කොමිසම වෙත ලැබෙන පරිදි අදාල අයදුම් පත සහ අයදුම් පත සමඟ යොමුකළ යුතු සියලුම පිටපත් තනි ලේඛනයක් ලෙස ලියාපදිංචි තැපෑල ඔස්සේ හෝ විද්‍යුත් තැපෑල ඔස්සේ යොමුකල යුතුය. වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ කාලරාමුව පිළිබඳව සලකා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හේතු දැක්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත.

ලියාපදිංචි තැපෑල ඔස්සේ යොමුකිරීමේ දී ලිපි කවරයේ වම් පස ඉහල කෙලවර **"කෙටි කාලීන පාඨමාලා සඳහා අයදුම්පත"** ලෙස සටහන් කල යුතු වන අතර විද්‍යුත් තැපෑල ඔස්සේ යොමුකිරීමේ දී විද්‍යුත් ලිපියේ විෂය ලෙස **"කෙටි කාලීන පාඨමාලා සඳහා අයදුම්පත"** ලෙස ද සටහන් කල යුතු වේ.

**11. නියමයන් සහ කොන්දේසි**

කිසියම් නව නිපැයුම්කරුවෙකු තමන්ට පිරිනමන ලද පාඨමාලාව සම්පූර්ණ කිරීමට අපොහොසත් වුවහොත්, එම සම්පූර්ණ පාඨමාලා ගාස්තුව හෝ ඊට අදාළ පිරිවැය කොටස නැවත කොමිසම වෙත ගෙවන තෙක්, එම නව නිපැයුම්කරුට කොමිසම වෙතින් කිසිදු සේවාවක් ලබා ගැනීමට නොහැකි වනු ඇත.

තෝරාගත් පාඨමාලාවක සම්පූර්ණ ගාස්තුව කොමිසම මගින් ලබාදෙන මූල්‍ය ආධාර සීමාව ඉක්මවා යන්නේ නම්, එම අතිරේක පිරිවැය දැරීමේ වගකීම අදාළ නව නිපැයුම්කරු සතු වේ. එම අතිරේක වියදම් දැරීමට නව නිපැයුම්කරු අපොහොසත් වන්නේ නම්, එම නව නිපැයුම්කරුට හිමිව තිබූ අවස්ථාව අහිමි වන අතර එය වෙනත් සුදුසුකම් ලත් නව නිපැයුම්කරුවෙකු වෙත ලබා දීමට කොමිසම කටයුතු කරනු ඇත.

## 12. වැඩිදුර තොරතුරු

වැඩිදුර පැහැදිලි කිරීම් සඳහා 0112676649 දුරකථන අංකය ඔස්සේ අප අමතන්න. එමෙන්ම info@slic.gov.lk විද්‍යුත් ලිපිනය ඔස්සේ ද විමසීම් සිදුකල හැකිය.